
# කවි මුතු වැල්




ආදර්ශ්නා ගජේන්ද්‍රා

# කවි මුතු වැල්



ආදර්ශ්නා ගජේන්ද්‍රා

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ" දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන්, ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20



# පිදුම

මට මේ කවි පොත ලියන්නට අවස්ථාව ලබා දී මාව
ගත්කතුවරියක් බවට පත් කරන්නට
මා උනන්දු කරවූ ගුරුමෑණිවරුන්ට, පියවරුන්ට,
මාගේ දෙමව්පියන්ට සහ පවුලේ සැමට මගේ
පොත ආදරයෙන් පිළිගන්වමි



# පටුන


1. බුදු සාදු ........................................................ 1
2. මගේ මල්ලි ........................................................ 2
3. අපි හොඳ ළමයි වෙමු ........................................................ 3
4. රෝස මල ........................................................ 4
5. පැන්සල ........................................................ 5
6. වැස්ස ........................................................ 6
7. දේදුන්න ........................................................ 7
8. මී මැස්සෝ ........................................................ 8
9. පඹ රාල ........................................................ 9
10. හාවා ........................................................ 10

# බුදු සාදු



අප සැමටම කරුණාවෙන්
අමා දම් දෙසූ
සාදු සාදු අපිත් වදිමු
අපෙ බුදු සාදු

# මගේ මල්ලි



බත් කන්නත් හරි හොරයි
නිතරම පැණි රස තමයි
පොත් වල වැඩ අමතකයි
මල්ලි මගේ හරි දඟයි

දවස පුරා සෙල්ලමයි
මාවත් නැතුවම බැරී
මල්ලි චුට්ටක් සැරයි
ඒත් එයා හරි හොඳයි

# අපි හොඳ ළමයි වෙමු




පුංචි අපිත් මල් වගෙයි
ටිකිරි සිනා සතුට දෙයි
කීකරු වට හැදෙන ළමයි
ලෝකෙම ලස්සන කරයි

# රෝස මල



රෝස කුසුම් ලස්සනයි
රතු පාටින් හරි හැඩයි
මල්වත්තට සුවඳ දෙයි
පුංචි අපිත් ඒ වගෙයි

# පැන්සල





දිගට දිගයි
පොතම ලියයි
පැන්සල මගේ
හරිම හැඩයි

අකුරු ලියයි
ගණන් හදයි
මගේ පැන්සල
හරි දක්ෂයි

# වැස්ස

වටින් පිටින් කළුවර වී
සුළඟ හමනවා
ගස් වල අතු  පැද්දෙනකොට
සිසිල දැනෙනවා
කුරුලු පැටවු බය වී
කිචි බීචි කියනවා
මහ වැස්සක් ළඟ එන බව
අපට දැනෙනවා




# දේදුන්න




පාට හතයි
හරිම ලොකුයි
අහස පුරා
දේදුන්නයි

සතුටු සිතයි
පුංචි අපියි
දෙව්ලොව යන
පාර මෙයයි

# මී මැස්සෝ



උදෑසනම කලබලයකි  මගේ මල් වත්තේ
කහපාටින් කලුපාටින් මී මැස්සන් නේ
පැණි බොන්නද මලින් මලට ඉගිලී යන්නේ
රැජිනට දෙන්නද ඔබ පැණි අරගෙන යන්නේ




# පඹ රාල



වලං මූණ හිසේ තියන්
පිදුරු කොණ්ඩෙ අවුල් කරන්
අත්තගේ කොටු සරම ඇඳන්
තනි කකුලෙන් ඉන්නේ හිටන්

කුරුල්ලන්ට ආදරෙයි
ඉත්තැවෝ බය කරයි
අපේ කොටුව රැකගනී
පඹයා නං හරි හොඳයි

# හාවා



වත්ත පහළ වෙළ  ගාවා
බතල කන්න එන හාවා
කන් දෙක දිග ඇස් වටකුරු
සුදුම සුදුයි පොඩි හාවා

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදයක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන් ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශ්වයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතු වරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතිය නිර්මාතෘ
2023.10.20



**ආදර්ශ්නා ගජේන්ද්‍රා**

978-624-206-593-9